# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපායස , බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1460 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 12/09/2024 පැය 1230

## මාධ්‍ය නිවේදනය

### පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු

**01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් අංශය.**

2024.09.11 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් අංශයේ නිලධාරීන් කණ්ඩායමක් වැල්ලම්පිටිය පොලිස් වසමේ වැල්ලම්පිටිය ප්‍රදේශයේ වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 09 මිලි ග්‍රෑම් 795 ක් සමඟ සැකකරුවකු අත්අඩංගුවට ගෙන වැල්ලම්පිටිය පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 39 ක් වූ වැල්ලම්පිටිය** පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර**

2024.09.11 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ ෆර්ගියුෂන් පාර ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 03 ක් හා ඩිජිටල් තරාදියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 45 ක් වූ කොළඹ 14 ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. ග්‍රෑන්ඩ්පාස් පොලිසිය** වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා රත්ගම කඳවුර**

2024.09.11 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා රත්ගම කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් අම්බලන්ගොඩ පොලිස් වසමේ දෙල්වත්ත ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර හෙරොයින් ග්‍රෑම් 03 මිලි ග්‍රෑම් 650ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන අම්බලන්ගොඩ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24 ක් වූ කුලීගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** අම්බලන්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04. ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා දඹුල්ල කඳවුර**

2024.09.11 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා දඹුල්ල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් දඹුල්ල පොලිස් වසමේ ලෙනදොර ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර අමු ගංජා කිලෝ 02 යි ග්‍රෑම් 650 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන දඹුල්ල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 28 ක් වන ලෙනදොර ප්‍රදේශයේ පදිංචිකරුවකු වේ.** දඹුල්ල පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**05. බලපත්‍ර නොමැතිව වැලි ප්‍රවාහනය කල සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පරයනාලන්කුලම් කඳවුර**

2024.09.11 වන දින අළුයම් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පරයනාලන්කුලම් කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් සිලාවතුර පොලිස් වසමේ විලාතිකුලම් ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර බලපත්‍ර නොමැතිව ට්‍රැක්ටර් රථයකින් වැලි ප්‍රවාහනය කළ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන සිලාවතුර පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 45 ක් වූ සිලාවතුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** සිලාවතුර පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**